**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - 2020**

-----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය කොමිෂන් සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරික්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, කොමිෂන් සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

--------------------------------------------------------------------

### 1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

--------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම්වල ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.මිලියන 67.2 ක් වූ වාහන ඇතුළුව ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබූ නමුත් තව දුරටත් භාවිතයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇති වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ස්ථාවර වත්කම්වල වටිනාකම හඳුනා ගැනීම සඳහා වන ප්‍රතිපත්තිය පිරිවැය ආකෘතිය වේ. ඒ අනුව ප්‍රමිත අංක 07, 41 වගන්තියට අනුව ගිණුම්වල වටිනාකම පෙන්වනු ලබන අතර වාර්ෂිකව ප්‍රත්‍යාගණනය කිරීමක් අවශ්‍ය නොවේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 08 හි 26 ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කරනුයේ අස්ථිත්වයක වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ එහි මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් මිස අනාගතයේ විය හැකි තත්ත්වයන් සම්බන්ධයෙන් නොවන අතර අනාගතයේදී මෙහෙයුම්වලට දැරීමට අවශ්‍යවන වියදම් සඳහා ප්‍රතිපාදන හඳුනා නොගත යුතුය. එසේ වුවද වාර්තාවේ | 2020 දෙසැම්බර් 31 දින වන විට නගර විශ්වවිද්‍යාල (City University) 09 ක් සඳහා වන ශක්‍යතා වාර්තා පිළියෙල කිරීමට උපදේශකවරුන් සහ ප්‍රධාන උපදේශක පත් කර තිබුණි. ඒ අනුව නගර විශ්වවිද්‍යාල (City University) 10 සඳහා නිශ්චිත වියදම වෙනුවෙන් එම මුදල ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත (SLPSAS 01) අංක 01, 07 වන | බඳවා නොගත් උපදේශකවරුන් සඳහා උපදේශන ගාස්තු වෙනුවෙන් ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශන නොගැලපිය යුතුය. |

| | | |
|---|---|---|
| දින වනවිට නගර විශ්වවිද්‍යාල 02 ක් සඳහා බඳවා නොගත් උපදේශකවරු 04 දෙනෙකු වෙනුවෙන් උපදේශක ගාස්තු ලෙස රු.මිලියන 4.4 ක් සමාලෝචිත වර්ෂය අවසානයේ දී ප්‍රතිපාදන කර තිබීම හේතුවෙන් එම ප්‍රමාණයෙන් වර්ෂයේ අතිරික්තය අඩුවෙන් හා ජංගම වගකීම් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | වගන්තිය අනුව උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කර ඇත. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ------------------------------ | ------------ |
| (අ) | භාණ්ඩාගාර ප්‍රදානයක් වශයෙන් ලද 2018 වර්ෂයේදී කොමිෂන් සභාව වෙත අයිතිය පවරා දී තිබූ වටිනාකම රු.මිලියන 4.3 ක් වූ මෝටර් රථයෙහි සාධාරණ අගය තක්සේරු කර ගිණුම්ගත කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කටයුතු කර නොතිබුණි. | මහා භාණ්ඩාගාරයේ පිරිවැයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂම වෙත ලබා දෙන ලද වාහනය පිළිබඳ විමසා බලා සුදුසු පරිදි පිරිවැය ගණනය කොට ගිණුම්ගත කිරීම සඳහා පියවර ගනු ලැබේ. | වත්කම්වල අයිතිය කොමිෂන් සභාව වෙත පවරා දුන් වර්ෂය තුළදීම අදාළ වත්කම් ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළව රු.මිලියන 1.8 ක වියදම් ගිණුම්වලින් අතහැරී තිබීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා උපචිත වියදම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයට අදාළ හඳුනා ගත නොහැකි වියදම් සඳහා උපචිත වියදමක් ලෙස ගිණුම්ගත කළ නොහැකි අතර නියමිත කාලරාමුවක් තුළ අවසන් ගිණුම් පිළියෙළ කිරීමේ දී එලෙස ඊළග වසරේ ජනවාරි අවසාන සතියේ, පෙබරවාරි සහ මාර්තු මාසවල ලැබෙන ගෙවීම්වලට අදාළව උපචිත වියදම් ලෙස සටහන් කිරීම ප්‍රායෝගිකව කළ නොහැකි විය. | වර්ෂයට අදාළ උපචිත වියදම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

--------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.මිලියන 29.9 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.මිලියන 12.3 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 17.6 ක් වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රජයේ ප්‍රදාන වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගවලින් පිරිපුන් සිසුන් බිහිකිරීමේ අරමුණින් 2010 වර්ෂයේ සිට 2020 වර්ෂයේ ජුනි දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් රු.මිලියන 452 ක මුදලක් දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ සාමාජික ගාස්තු ලෙස කොමිෂන් සභාව විසින් දරා තිබුණ ද ශ්‍රී ලාංකික සිසුන්ගේ දක්ෂතා හා දැනුම වර්ධනය කිරීම සහ ඒ තුළින් නායකත්ව ගුණාංගයන්ගෙන් පිරිපුන් සිසුන් බිහිකිරීමට දායකත්වයක් ලබා දී ඇති බව නිරීක්ෂණය නොවුණි. | දකුණු ආසියානු විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාවන් අධ්‍යයනය කොට එම විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සහ අනෙකුත් පරිපාලන කටයුතු සිදුවන ආකාරය පිළිබඳව වාර්තාවක් ලබාදෙන ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණකවරයා වෙත උපදෙස් ලබා දී ඇත. | විදේශීය උසස් අධ්‍යාපන ආයතනයක් වෙත දීර්ඝ කාලීනව ගෙවනු ලබන සාමාජික ගාස්තු වලින් ශ්‍රී ලාංකික සිසුන් වෙත ලැබිය යුතු ප්‍රතිලාභ ළඟාකර ගැනීමට අවශ්‍ය පියවර අප්‍රමාදව ගත යුතුය. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේදී 2016/2017 අධ්‍යයන වර්ෂයේ සිට 2019/2020 අධ්‍යයන වර්ෂය දක්වා පිළිවෙළින් 897, 738, 2,226 ක් හා 2,461 වශයෙන් පුරප්පාඩු පැවති අතර එම පුරප්පාඩු 2021 ජුනි 24 දින දක්වා සම්පූර්ණ කිරීමට කටයුතු කර නොතිබුණි. | බඳවා ගත් ප්‍රථම වටය අවසානයේ පැවති පුරප්පාඩු 5505 න් තවදුරටත් පුරප්පාඩු 2461 ක් පැවතුණි. | විශ්වවිද්‍යාල වල පවත්වාගෙන යනු ලබන උපාධි පාඨමාලා වලට ඇතුළත් කර ගත හැකි උපරිම ශිෂ්‍ය සංඛ්‍යාව බඳවා ගැනීමට කළමනාකරණයේ අවධානය අප්‍රමාදව යොමු විය යුතුය. |
| (ආ) | 2019 වර්ෂයේ පැවැත්වූ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ ප්‍රතිඵල 2019 දෙසැම්බර් 27 දින නිකුත් කර තිබුණ ද විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා මාර්ගගත ක්‍රමය යටතේ අයදුම්පත් කැඳවීම මාස 02 කට අධික කාලයක් ප්‍රමාද කර 2020 මාර්තු 05 වන දින ආරම්භ කර තිබුණි. තව ද 2020 ඔක්තොම්බර් 12 වන | 2019 වර්ෂයේ අ.පො.ස. උසස් පෙළ විභාගය නව සහ පැරණි නිර්දේශ යන කාණ්ඩ දෙකට වෙන වෙනම කඩඉම් ලකුණු ගණනය කිරීමට සිදු වූ හෙයින් අනෙකුත් වර්ෂ වලට වඩා වැඩි කාලයක් ගත විය. | උසස් පෙළ විභාගයේ ප්‍රතිඵල මත කඩඉම් ලකුණු බලාපොරොත්තුවෙන් සිටින සිසුන්ට විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා අහිමි වුවහොත් නැවත විභාගයට සූදානම්වීමට අවස්ථාව ලැබෙන පරිදි ප්‍රමාදයකින් තොරව කඩඉම් ලකුණු නිකුත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | දින 2020 වර්ෂයේ අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය ආරම්භ කර තිබුණ ද එදිනට පෙර කඩඉම් ලකුණු නිකුත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අපොහොසත් වීම හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශ අවස්ථා අහිමි වී ගිය සිසුන්ට 2020 වර්ෂයේ උසස් පෙළ විභාගයට සූදානම්වීමට හා පෙනී සිටීමට තිබූ අවස්ථාව මග හැරී තිබුණි. | | |
| (ඇ) | 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාල 03 ක් වෙත මාර්ගගත ක්‍රමය අනුව සිසුන් බඳවා ගැනීමට අදාළ පරිගණක මෘදුකාංග ස්ථාපිත කිරීම සඳහා එකතුව රු.මිලියන 10.2 ක අත්තිකාරම් මුදලක් ලබා දී සමාලෝචිත වර්ෂයේ අවසානය වනවිට වසර 02 සිට වසර 05 දක්වා කාලයක් ගතවී තිබුණ ද අදාළ කාර්යයන් නිමකර අත්තිකාරම් නිරවුල් කිරීමට වාර්තාවේ දිනය දක්වාම කටයුතු කර නොතිබුණි. | වසරින් වසර විශ්වවිද්‍යාල ප්‍රවේශ අයදුම්පත් කැඳවීමේ ක්‍රියාවලියෙහි සිදු වූ වෙනස්කම් අදාළ විශ්වවිද්‍යාල මඟින් යාවත්කාලීන කර ගැනීමට සිදු වූ හෙයින්, අදාළ කාර්යයන් සාර්ථකව නිම කළ බවට තහවුරු කර ගැනීම ප්‍රමාද විය. නමුත් දැනට එම කටයුතු අවසන් කර ඇති බැවින් අදාළ තහවුරු කිරීම් ලබා ගෙන කාර්යය අවසන් කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ අත්තිකාරම් මුදල් නොපමාව නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |

### 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය<br>-------------------- | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම<br>-------------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 12 කට අදාළ ව්‍යාපෘති යෝජනා 20 ක් වෙනුවෙන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා දී වසර 01 සිට වසර 13 දක්වා කාලපරාසයක් ගත වී තිබුණ ද අදාළ ව්‍යාපෘතිවල වැඩ ආරම්භ කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම අදාළ උසස් අධ්‍යාපන ආයතන අපොහොසත් වී තිබුණි. | ප්‍රමාණවත් ව්‍යාපෘති ප්‍රතිපාදන නොලැබීම, ඉදිකිරීම් කටයුතු කිරීමට සුදුසු වැඩ බිමක් සොයා ගැනීමට අපහසු වීම, ඉඩමක් තිබුණ ද එම ඉඩම් නිරවුල් කර ගැනීමේ කටයුතු ප්‍රමාද වීම, කොවිඩ් 19 වසංගත තත්ත්වය හා පසුගිය වර්ෂවල අයවැය සීමාවන් හේතුවෙන් නව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම අත්හිටුවීම ප්‍රමාදයන්ට හේතු වී තිබුණි. | පෙර ශක්‍යතා අධ්‍යයනයක් සිදුකර ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ හැකියාව තහවුරු කර ගැනීමෙන් අනතුරුව ව්‍යාපෘතිවලට අදාළ ප්‍රසම්පාදන කටයුතු කිරීම හා ගිවිසුම්වලට එළඹීම සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන 10 කට අදාළ ව්‍යාපෘති යෝජනා වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී වසර 03 සිට වසර 11 දක්වා කාලයක් ගත වී තිබුණ ද ලංසු ප්‍රදානය කිරීම ප්‍රමාදවීම, වැඩ ආරම්භ කිරීම සහ ව්‍යාපෘතිය අවසන් කළ යුතු නියමිත කාලය දීර්ඝ කිරීම යනාදී හේතූන් මත ව්‍යාපෘති 18 ක මූල්‍ය ප්‍රගතිය සියයට 8 සිට සියයට 50 ක් වැනි ඉතා අඩු මට්ටමක පැවතුණි. | 2018 හා 2019 වර්ෂයන් තුළ ප්‍රාග්ධන අරමුදල් නිදහස් කිරීම පහළ මට්ටමක පැවතීම, කොන්ත්‍රාත්කරුවන්ගේ බිල්පත් නිසි පරිදි පියවීමට නොහැකි වීම, 2019 වර්ෂයේ ඇති වූ ඉරුදින පාස්කු ප්‍රහාරය හේතුවෙන් ආරක්ෂක හේතූන් මත සහ 2020 වර්ෂයේ දී ඇති වූ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුවන්ට ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමද භෞතික ප්‍රගතිය පහළ මට්ටමක පැවතීමට හේතුවිය. | ව්‍යාපෘති ප්‍රමාදය අවම කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගෙන කඩිනමින් ව්‍යාපෘති නිම කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.4 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 21 වන සියවසට සරිලන පරිදි විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවක කේන්ද්‍රීය මූල්‍ය තොරතුරු පද්ධතියක් 2020 ජුනි මාසය වනවිට හඳුන්වාදීමට සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂා කර තිබුණ ද වර්ෂය අවසන් වනවිට එහි ප්‍රගතිය සියයට 50 ක් පමණක් වී තිබුණි. | 2020 වසරේ මුල සිටම පවතින කොරෝනා වසංගත තත්ත්වය යටතේ මෙම කටයුතු සිදුකර ගෙන යනු ලබන බැවින් අපේක්ෂිත කාර්යසාධන මට්ටමට ළඟා වීමට ප්‍රමාදයක් පවතී | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙන් ළඟාකර ගැනීමට අපේක්ෂා කරන අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. |
| (ආ) | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත සමාලෝචනය කර යාවත්කාලීන කිරීම, සිසුන් බඳවා ගැනීම පුළුල් කිරීම සඳහා රජයේ උසස් අධ්‍යාපන අංශය ප්‍රතිව්‍යුහගත කිරීම හා වර්තමාන සහ අනාගත උසස් අධ්‍යාපන අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි උසස් අධ්‍යාපන ආයතන සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම යන කාර්යයන් ඉටුකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළ දී අපේක්ෂා කර තිබුණ ද වර්ෂය අවසාන වනවිට එහි ප්‍රගතිය සියයට 25 ක් වැනි පහළ මට්ටමක පැවතුණි. | 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත විශේෂ කාර්යයන් අරමුණු කර ගනිමින් විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීමට පියවර ගෙන ඇත. එසේම කාලීන අවශ්‍යතාවය මත පාදක වූ නව විධිවිධාන ඇතුළත් කරමින් උක්ත පනතට දැනටමත් විද්වත් කමිටුවක් විසින් නව සංශෝධන ඇතුළත් පනත් කෙටුම්පතක් සකස් කොට ඇත. එය සකස් කිරීම සඳහා අදාළ පාර්ශයන් සමඟ සාකච්ඡා කොට අදහස් ලබා ගැනීමට සහ යෝජිත කෙටුම්පත් සැකසීම සඳහා යම් කාලයක් ගත වීම මෙම ප්‍රමාදයන්ට හේතු වී තිබුණි. | වර්තමාන රැකියා වෙළඳපලට ගැලපෙන පරිදි උසස් අධ්‍යාපන ආයතනවල පාඨමාලා සමාලෝචනය කිරීම හා යාවත්කාලීන කිරීම මෙන්ම වැඩි පිරිසකට උසස් අධ්‍යාපන අවස්ථා සැළපෙන පරිදි උසස් අධ්‍යාපන ආයතන ප්‍රතිව්‍යුහ ගත කිරීම හා නීතිමය ප්‍රතිපාදන ඇති කර ගැනීම කඩිනම් කළ යුතුය. |